# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

## අදියර 01

# 1901 - මූල්‍ය ගිණුම්කරණය [FAC]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
**1901 - මූල්‍ය ගිණුම්කරණය (FAC)**
**නියාමක ප්‍රශ්න පත්‍රය**

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 40 |
| B | 40 |
| C | 20 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50 කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**A කොටස**

(එකකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 40)

**01 වන ප්‍රශ්නය**

අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

**1.1.** පහත සඳහන් ඒවා අතුරෙන්, ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණක් තෝරන්න:

(1) කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමට.

(2) රජයට තොරතුරු සැපයීමට.

(3) ව්‍යාපාරයේ මූල්‍ය කාර්යසාධනය අවබෝධ කර ගැනීමට.

(4) ව්‍යාපාරයේ නිෂ්පාදනවල විකුණුම් මිල තීරණය කිරීමට.

**1.2.** **කපිල ට්‍රේඩර්ස්** විසින් **DGL** සැපයුම්කරුගෙන් ණයට මිලදී ගත් රු.400,000/- ක් වටිනා භාණ්ඩ ආපසු හරවා යවා ඇත. ඉහත ගනුදෙනුව වාර්තා කිරීම සඳහා **කපිල ට්‍රේඩර්ස්** විසින් භාවිතා කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලේඛණය වන්නේ:

(1) විකුණුම් ඉන්වොයිසියයි. (2) මුදල් ලදුපතයි.

(3) බැරපතයි. (4) හර පතයි.

**1.3.** **සරත් ට්‍රේඩර්ස්** විසින් **සීමාසහිත මෙට්‍රොපෝලෝ (පෞද්ගලික) සමාගමෙන්** කාර්යාලයේ පරිහරණය සඳහා රු.200,000/- ක කාර්යාල උපකරණයක් ණයට මිලදී ගෙන ඇත.

ඉහත ගනුදෙනුව වාර්තා කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

(1) මෙට්‍රොපොලෝ ගිණුම - හර සහ මුදල් ගිණුම - බැර.

(2) කාර්යාල උපකරණ ගිණුම - හර සහ මුදල් ගිණුම - බැර.

(3) කාර්යාල උපකරණ ගිණුම - හර සහ වෙනත් ගෙවිය යුතු ගිණුම - බැර.

(4) කාර්යාල උපකරණ ගිණුම - හර සහ ප්‍රාග්ධන ගිණුම - බැර.

**1.4.** **නවාස් ට්‍රේඩර්ස්** යනු **නවාස්** සතු කේවලස්වාමි ව්‍යාපාරයකි. **නවාස්ගේ** දුරකථන බිල්පතක් ව්‍යාපාරය විසින් ගෙවන ලද අතර එය ව්‍යාපාරයේ ගැනිලි ලෙස සලකනු ලැබීය. ඉහත ප්‍රකාශයට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අස්තිත්ව සංකල්පයයි.
(2) විචක්ෂණ සංකල්පයයි.
(3) උපචිත සංකල්පයයි.
(4) ගැලපුම් සංකල්පයයි.

**1.5.** පහත සඳහන් ගිණුම්කරණ පැකේජවලින් පොදු ගිණුම්කරණ පැකේජයක් තෝරන්න:

(1) වැටුප් පද්ධතිය.
(2) තොග කළමනාකරණ පද්ධතිය.
(3) Tally පද්ධතිය.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.6.** පහත සඳහන් තොරතුරු කේවලස්වාමි ව්‍යාපාරයක් වන **XYZ ට්‍රේඩර්ස්** හි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

| | රු. |
|---|---|
| 2024 අප්‍රේල් 01 වන දිනට ප්‍රාග්ධනය | 5,000,000 |
| 2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 1,800,000 |
| 2025 මාර්තු 31 වන දිනට වගකීම් | 2,750,000 |
| 2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය තුළදී සිදුකළ ගැනිලි | 400,000 |

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්, 2025 මාර්තු 31 වන දිනට ව්‍යාපාරයේ මුළු වත්කම් වූයේ:

(1) රු.9,150,000/-.
(2) රු.3,650,000/-.
(3) රු.9,950,000/-.
(4) රු.8,750,000/-.

**1.7.** ආදායම් ප්‍රකාශනයේ මූලිකාංගයක් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) වගකීම්.
(2) ආදායම්.
(3) ස්කන්ධය.
(4) වත්කම්.

**1.8.** ලෙජර් ගිණුම් නාමික ගිණුම්, මූර්ත ගිණුම් සහ පුද්ගලික ගිණුම් ලෙස සාම්ප්‍රදායිකව, වර්ගීකරණය කළ හැකිය. ලෙජර්වල සාම්ප්‍රදායික වර්ගීකරණය යටතේ හිමිකරු විසින් සිදුකරන ලද ගැනිලි සඳහා නිවැරදි වර්ගීකරණය වනුයේ:

(1) පුද්ගලික ගිණුමයි. (2) නාමික ගිණුමයි.

(3) මූර්ත ගිණුමයි. (4) ඉහත කිසිවක් නොවේ.

**1.9.** පහත සඳහන් ඒවායින්, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය (NRV) යන දෙකෙන් අඩු අගයට මැනීමට අදාල ගිණුම්කරණ සංකල්පය තෝරන්න.

(1) උපචිත සංකල්පය. (2) ගැළපුම් සංකල්පය.

(3) සංගතතා සංකල්පය. (4) ආරක්ෂණ සංකල්පය.

**1.10.** "**යුනිමෝ ට්‍රේඩර්ස්** විසින් 5% ක වට්ටමකට යටත්ව වෙළඳ ණයහිමියෙකුට රු. 200,000/- ක ඉන්වොයිසියක් ගෙවා ඇත". පහත සඳහන් ඒවා අතුරෙන් මෙම ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න:

| | **වත්කම් (රු.)** | **=** | **ස්කන්ධය / ප්‍රාග්ධනය (රු.)** | **+ වගකීම් (රු.)** |
|---|---|---|---|---|
| (1) | - 200,000 | = | - | - 200,000 |
| (2) | - 180,000 | = | + 20,000 | - 200,000 |
| (3) | - 190,000 | = | + 10,000 | - 200,000 |
| (4) | + 190,000 | = | - 10,000 | + 200,000 |

පහත සඳහන් එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

**1.11** අරමුණුගත බව යනු ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කරනු ලබන ආචාර ධර්ම සංග්‍රහයේ මූලධර්මයකි.

**1.12** උපචිත සංකල්පයට අනුව, මුදල් ලැබීම හෝ නොලැබීම නොසලකා නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී අයභාරය හඳුනා ගැනේ.

**1.13** සියලුම ගිණුම්කරණ වැරදි, ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමෙන් අනාවරණය කර ගත හැකිය.

**1.14** අදාළබව, මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයකි.

**1.15** පොදු ලෙජරය යනු මූලික සටහන් පොතකි.

අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.

**1.16** පහත සඳහන් ගනුදෙනු දෙකට (02) අදාළ මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්නः

(a) රු.200,000/-ක බොල් ණය කපා හැරීම.

(b) නැවත විකිණීමේ අරමුණෙන් රු.200,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගැනීම.

**1.17** පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංගයක අවාසි දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

**1.18** **ගිම්සර ට්‍රේඩර්ස්** හි 2025 මාර්තු 31 වන දිනට වෙළඳ ලැබිය යුතු පාලන ගිණුමේ ශේෂය රු.100,000/- ක් වූ අතර වෙළඳ ණයගැතියන්ගේ ලෙජරයට අනුව ශේෂය පාලන ගිණුම් ශේෂයට වඩා වෙනස් විය. ණයගැතියන්ගේ ලෙජරය සහ පාලන ගිණුම අතර වෙනස සඳහා ගිණුම් විධායක විසින් පහත සඳහන් හේතු සටහන් කර ඇතः

- රු.10,000/- කින් ලියා හල බොල් ණය, පාලන ගිණුමේ පමණක් සටහන් කර නොමැත.
- වෙළඳ ණයගැතියෙකුගෙන් ලැබුණු මුදලක්, ණයගැති පාලන ගිණුමේ රු.8,000/- ක් අඩුවෙන් සටහන් කර ඇත.
- විකුණුම් ජර්නලය රු.5,000/- කින් වැඩියෙන් එකතු කර ඇත.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2025 මාර්තු 31 වන දිනට නිවැරදි කරන ලද වෙළඳ ලැබිය යුතු පාලන ගිණුම් ශේෂය ගණනය කරන්න.

**1.19** ජංගම වගකීම් සඳහා උදාහරණ දෙකක් (02) සඳහන් කරන්න.

**1.20** ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමේ  වාසි දෙකක් (02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 40)

**A කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.**

(මුළු ලකුණු 40)

**B කොටස**

**02 වන ප්‍රශ්නය**

**හසාලි** 2025 අප්‍රේල් 01 වන දින **හෂෝ ට්‍රේඩර්ස්** ආරම්භ කළ අතර, පහත සඳහන් ගනුදෙනු 2025 අප්‍රේල් මාසය තුළ සිදු විය:

(1) **හසාලි** 2025 අප්‍රේල් 01 වන දින රු.500,000/- ක් මුදලින් සහ රු.1,500,000/- ක් වටිනා යන්ත්‍රෝපකරණ මූලික ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.

(2) 2025 අප්‍රේල් 03 වන දින නැවත විකිණීම සඳහා **මෝතා (පුද්ගලික) සමාගමෙන්** රු.800,000/-ක් වටිනා භාණ්ඩ ණයට ගන්නා ලදී.

(3) රු.300,000/- ක පිරිවැයක් ඇති භාණ්ඩ **අෂිනිට** රු.500,000/- කට ණයට විකුණන ලදී.

(4) අප්‍රේල් මාසයේ විදුලි බිල රු.20,000/- ක් වූ අතර එය 2025 අප්‍රේල් 15 වන දින **හසාලි** විසින් ගෙවන ලදී. මෙම මුදල අමතර ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස සැලකීමට **හසාලි** විසින් තීරණය කරන ලදී.

(5) **අෂිනි,** 2025 අප්‍රේල් 26 වන දින රු.400,000/- ක මුදලක් පියවා ඇති අතර, එය 10% ක මුදල් වට්ටමකට යටත් වේ.

(6) **හසාලි** ඇයගේ පුද්ගලික පරිහරණය සඳහා රු.50,000/- ක භාණ්ඩ ලබාගෙන ඇත.

(7) යන්ත්‍රෝපකරණ සඳහා 2025 අප්‍රේල් මාසය සඳහා අදාළ වන ක්ෂයවීම රු.10,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත ගනුදෙනුවලින්, පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න**:

*(යන්ත්‍ර + තොගය + වෙළෙඳ ලැබිය යුතු මුදල් + මුදල් = ස්කන්ධය / (ප්‍රාග්ධනය) + වගකීම්)*

(ලකුණු 07)

(b) 2025 අප්‍රේල් 30 වන දිනෙන් අවසන් වූ මාසය සඳහා ලාභය **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**(A)** කේවලස්වාමි ව්‍යාපාරිකයෙක් වන **සෙහන්සා ට්‍රේඩර්ස්** සහල් තොග වෙළඳාමේ නියැලී සිටියි. 2025 අප්‍රේල් මාසය තුළ සිදුකළ ණයට විකුණුම් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු අදාළ වේ:

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරු | අයිතම | ප්‍රමාණය | ඒකක මිල (රු.) | වෙළඳ වට්ටම් |
|---|---|---|---|---|---|---|
| 2025-04-05 | S145 | චමිදු ට්‍රේඩර්ස් | කීරි සම්බා | 200Kg | 200 | 5% |
| 2025-04-10 | S146 | රුසිරු ට්‍රේඩර්ස් | සුදු සම්බා | 500Kg | 250 | 10% |
| 2025-04-14 | S147 | චමත් ට්‍රේඩර්ස් | බාස්මතී | 300Kg | 500 | - |
| 2025-04-20 | S148 | සජීධා ට්‍රේඩර්ස් | නාඩු | 100Kg | 180 | 5% |

**ඔබ විසින් කළ යුතු දෑ :**

2025 අප්‍රේල් මාසය සඳහා, **සෙහන්සා ට්‍රේඩර්ස්** හි දෛනික විකුණුම් පොත (විකුණුම් ජර්නලය) **පිළියෙළ කරන්න.** (ලකුණු 05)

**(B)** 2025 මාර්තු 31 වන දිනට, **මනුකා ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.200,000/- ක වාසිදායක (හර) ශේෂයක් පෙන්වූ අතර, මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය සමග එකඟ නොවීය. 2025 මාර්තු 31 වන දිනට බැංකු ප්‍රකාශයේ රු.270,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරයි.

වෙනස සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගෙන ඇත:

(1) **මනුකා ට්‍රේඩර්ස්** විසින් රු. 50,000/- ක මාසික ණය වාරිකය ගෙවීමට ස්ථාවර නියෝග ලබා දී ඇත. කෙසේවෙතත්, මෙය මුදල් පොතේ මඟ හැර තිබුණි.

(2) ව්‍යාපාරයේ ණයගැතියෙකු විසින් රු. 65,000/- ක ඍජු තැන්පතුවක් සිදු කර ඇත. මෙය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(3) 2025 මාර්තු 28 වන දින, **මිනෝලි (පුද්ගලික) සමාගම** යන සැපයුම්කරුට රු.100,000/- ක චෙක්පතක් ලබාදී ඇත. කෙසේවෙතත්, මෙය 2025 අප්‍රේල් 02 වන දින බැංකුවට ඉදිරිපත් කරන ලදී.

(4) 2025 මාර්තු 30 වන දින බැංකු ගිණුමේ තැන්පත් කරන ලද රු.80,000/- ක චෙක්පතක් 2025 මාර්තු අවසානය වන විටත් උපලබ්ධි නොවී තිබුණි.

(5) රු.5,000/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොමැත.

(6) බැංකුව විසින් **මනුකා ට්‍රේඩර්ස්** හි ජංගම ගිණුමට රු.40,000/- ක් වැරදි ලෙස බැර කර තිබුණි. ප්‍රකාශනයේ ශේෂයේ මෙම දෝෂය නිවැරදි කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ :**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2025 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**උදාර ප්‍රකාශන** පොත් මුද්‍රණ ව්‍යාපාරයේ නියැලී සිටියි. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **උදාර ප්‍රකාශන** ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2024 අප්‍රේල් 01 වන දිනට අමුද්‍රව්‍ය තොගය | 500,000 |
| වසර තුළ මිලදී ගත් අමුද්‍රව්‍ය | 6,000,000 |
| 2024 අප්‍රේල් 01 වන දිනට නොනිමි තොග (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 230,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 100,000 |
| සෘජු වැටුප | 2,500,000 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු | 60,000 |
| ආරක්ෂක ගාස්තු | 600,000 |
| විදුලිය | 900,000 |
| කුළිය | 1,000,000 |
| යන්ත්‍ර (පිරිවැයට) | 2,000,000 |
| මෝටර් ලොරි රථය (පිරිවැයට) | 1,500,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 වන දිනට අවසන් තොග ශේෂයන් පහත පරිදි අගය කරන ලදී:

| විස්තරය | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | 300,000 |
| නොනිමි තොග (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 430,000 |

(2) පහත සඳහන් වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන් කළ යුතුය:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| ආරක්ෂක ගාස්තු | 70% | 30% |
| විදුලිය | 80% | 20% |
| කුළිය | 80% | 20% |

(3) පොත් මුද්‍රණය කිරීම සඳහා පිරියත සහ යන්ත්‍ර භාවිතා කරන අතර, මුද්‍රිත පොත් පාරිභෝගිකයින්ට බෙදා හැරීම සඳහා ව්‍යාපාරය විසින් මෝටර් ලොරි රථය භාවිත කරයි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

යන්ත්‍ර : 20%

මෝටර් ලොරි රථය : 25%

(4) යන්ත්‍ර ක්‍රියාකරුවන්ට පොතකට රු.50/- ක නිෂ්පාදන දිරිගැන්වීමක් ලබා දෙන අතර, වසර තුළ පොත් 10,000ක් මුද්‍රණය කරන ලදී.

(5) නිෂ්පාදන පිරිවැයෙන් 20% ක ලාභයක් තබා ගනිමින් නිෂ්පාදිත අයිතම, වෙළඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබට විසින් කළ යුතු දෑ:**

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **උදාර ප්‍රකාශන** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

ගිණුම් විධායක විසින් 2025 මාර්තු 31 වන දිනට පිළියෙල කරන ලද **තරුන් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුමේ ශේෂය එකඟ නොවූ අතර රු.170,000/- ක වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කරන ලදී. පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ ශේෂය භාවිතා කරමින්, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ අතර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.450,000/-ක අලාභයක් වාර්තා කරන ලදී.

වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනා ගන්නා ලදී:

(1) 2025 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු වැටුප රු.100,000/- ක් විය. මෙය ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(2) රු.50,000/- ක පොලී ආදායම, පොලී වියදමක් ලෙස සටහන් කර ඇත. කෙසේවෙතත්, මුදල් ලැබීම් මුදල් පොතේ නිසි ලෙස සටහන් කර තිබුණි.

(3) 2025 මාර්තු 31 වන දින සිදු කරන ලද රු.40,000/- ක මෝටර් රථ අලුත්වැඩියා වියදම, වැරදි ලෙස මෝටර් රථ ගිණුමට ප්‍රාග්ධනිත කර ඇත.

(4) රු.25,000/- ක මුදල්වලින් කරන ලද ලිපි ද්‍රව්‍ය වියදම්, ලිපි ද්‍රව්‍ය ගිණුමේ දෙවරක් සටහන් කර ඇති අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත.

(5) 2025 පෙබරවාරි මාසය සඳහා ගෙවන ලද රු.16,000/- ක දුරකථන වියදම, කුලී වියදම් ගිණුමේ රු.61,000/- ලෙස සටහන් කර ඇත. කෙසේවෙතත්, අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**පහත සඳහන් දෑ පිළියෙල කරන්න:**

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 02)

(c) නිවැරදි කළ ලාභය පෙන්වීමට ප්‍රකාශනයක්. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**B කොටසෙහි අවසානය**

| අනිවාර්ය ප්‍රශ්න එක (01) කි. | **C කොටස** |
|---|---|
| (මුළු ලකුණු 20) | |

**06 වන ප්‍රශ්නය**

CodeLoom යනු **හෙනුකාට** අයර් කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2025 මාර්තු 31 වන දිනට CodeLoom හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**CodeLoom**

**2025 මාර්තු 31 වන දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපල, පිරියත සහ උපකරණ පිරිවැයට | | |
| ඉඩම් සහ ගොඩනැගිලි (ඉඩම් පිරිවැයට රු. මිලියන 5) | 11,000 | |
| යන්ත්‍ර | 9,000 | |
| මෝටර් වාහන | 5,000 | |
| 2024 අප්‍රේල් 01 වන දිනට සමුච්චිත ක්ෂයවීම්: | | |
| ගොඩනැගිලි | | 3,000 |
| යන්ත්‍ර | | 4,500 |
| මෝටර් වාහන | | 2,500 |
| විකුණුම් | | 92,000 |
| 2024 අප්‍රේල් 01 වන දිනට තොගය | 8,500 | |
| මිලදී ගැනුම් | 63,000 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 7,700 | |
| 2024 අප්‍රේල් 01 වන දිනට වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන | | 300 |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 5,275 |
| බැංකුවේ ඇති මුදල් | 500 | |
| අතැති මුදල් | 25 | |
| බැංකු ණය | | 8,000 |
| වැටුප් සහ වේතන | 15,500 | |
| රක්ෂණ වියදම් | 600 | |
| ආරක්ෂක ගාස්තු | 750 | |
| ගෙවූ විදුලි බිල්පත් | 3,100 | |
| විකුණුම් කොමිස් | 400 | |
| ගෙවූ කාර්යාල කුලිය | 3,500 | |
| 2024 අප්‍රේල් 01 වන දිනට ප්‍රාග්ධන ගිණුම | | 13,000 |
| **එකතුව** | **128,575** | **128,575** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට අවසන් තොගය රු. 9,700,000/- ක පිරිවැයට අගය කරන ලදී.

(2) මාර්තු මාසය සඳහා වන රු. 78,000/- ක විදුලි බිල ගිණුම් පොත්වල සටහන් කර නොමැත. මෙය 2025 අප්‍රේල් 03 වන දින ගෙවන ලදී.

(3) 2025 ජනවාරි 01 වන දින, ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා 12% ක වාර්ෂික පොලී අනුපාතයකට **මෙට්‍රෝ බැංකුවෙන්** රු. 8,000,000/- ක බැංකු ණයක් ලබාගෙන ඇත. ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම් සඳහා බැංකුව වසරක (01) සහන කාලයක් ලබා දී ඇත. වර්ෂය සඳහා පොලිය ගිණුම්ගත කර නොමැත.

(4) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | - | වාර්ෂිකව 10% බැගින් |
| යන්ත්‍ර | - | වාර්ෂිකව 20% බැගින් |
| මෝටර් වාහන | - | වාර්ෂිකව 25% බැගින් |

(5) ව්‍යාපාරය, 2024 අප්‍රේල් 01 වන දින නව කුලී ගිවිසුමකට එළඹුණි. නව කුලී ගිවිසුමට අනුව රු. 500,000/- ක කුලී තැන්පතුවක් ගෙවන ලද අතර, මෙය වසර දෙකක (02) කුලී කාලය අවසානයේ ලබා ගත හැකිය. මාසික කුලිය රු. 300,000/- කි. ගෙවන ලද කුලී තැන්පතුව සහ වර්ෂය සඳහා ගෙවන ලද කුලිය ශේෂ පිරික්සුමේ, ගෙවන ලද කාර්යාල කුලි යටතේ සටහන් කර ඇත.

(6) CodeLoom විසින් රු.200,000/- ක දිගුකාලීන හිඟ ණයගැති ශේෂයක්, බොල් ණයක් ලෙස කපා හැරීමට සහ 2025 මාර්තු 31 වන දිනට ඉතිරි වෙළඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක් වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනයක් (අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය) කිරීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ :**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

**C කොටසෙහි අවසානය**

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **මතක තබා ගැනීම**<br><br>කරුණු,පද,මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න. | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න. | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| **අවබෝධය**<br><br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ඨිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිපතව ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **භාවිතය**<br><br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ. | භාවිත කරන්න. | යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම. | ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම. |
| | ගණනය කරන්න. | ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම. | විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම. |
| | තීරණය කරන්න | පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම. | ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම. |
| | ප්‍රදර්ශනය කරන්න. | ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම. | ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම. |
| | පිළියෙල කරන්න. | භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම. | කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම. |
| | භාවිත කරන්න | සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම. | අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම. |
| | ඉදිරිපත් කරන්න. | සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම. | මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම. |
| **විශ්ලේෂණය**<br><br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම | විශ්ලේෂණය කරන්න. | සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම. | වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම. |
| | සසඳන්න | සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම. | ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම. | යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම. |
| | පරීක්ෂා කරන්න | යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම. | යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරිම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. | ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම. |
| | ක්‍රියා කරන්න | අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම. | කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම. |
| | වාර්තා කරන්න | සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම. | විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **අගය කරන්න**<br><br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| **නිර්මාණය කිරීම**<br><br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කාණුකුල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

# අදියර 01

# 1901 - මූල්‍ය ගිණුම්කරණය [FAC]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස(20) කි.**

## A කොටස

(මුළු ලකුණු 40)

**01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | |
|---|---|
| **1.1** | (3) |
| **1.2** | (4) |
| **1.3** | (3) |
| **1.4** | (1) |
| **1.5** | (3) |
| **1.6** | (1) |
| **1.7** | (2) |
| **1.8** | (2) |
| **1.9** | (4) |
| **1.10** | (3) |
| **1.11** | සත්‍යයි |
| **1.12** | සත්‍යයි |
| **1.13** | අසත්‍යයි |
| **1.14** | සත්‍යයි |
| **1.15** | අසත්‍යයි |

1.16 **(a)** ජර්නල් වවුචරය

**(b)** ගැනුම් ඉන්වොයිසිය

1.17 **පරිගණකගත ගිණුම්කරණයේ අවාසි:**

- ඉහළ ආයෝජන පිරිවැය.
- තාක්ෂණික දැනුමේ අවශ්‍යතාවය.
- තාක්ෂණික කාර්ය මණ්ඩලය රඳවා ගැනීම.
- මානව දෝෂ හේතුවෙන් සිදුවන අසාර්ථකත්වයන්.
- රැකියා වෙළඳපොළට වන බලපෑම්.
- සංකීර්ණ ස්වභාවය.

**(අවාසි 2 ක් පමණක් අපේක්ෂා කෙරේ)**

1.18

**වෙළඳ ලැබිය යුතු මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේ/ඉ/ගෙ | 100,000 | මග හැරුණු ශේෂය | 8,000 |
| | | වැඩියෙන් දක්වා ඇති ශේෂය | 5,000 |
| | | ශේ/ප/ගෙ | **87,000** |
| | **100,000** | | **100,000** |

1.19 වෙළඳ ගෙවිය යුතු මුදල්

බැංකු අයිරාව

උපචිත ගාස්තු

ගෙවිය යුතු ආදායම් බදු **(අවාසි 2 ක් පමණක් අපේක්ෂා කෙරේ)**

1.20 ලෙජර් ශේෂයන්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට.

ශේෂ පිරික්සුමෙන් අනාවරණය කර ගත හැකි ඕනෑම වැරැද්දක් හඳුනා ගැනීමට.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පහසු වීම.

ගිණුම්කරණ ගැලපීම් කිරීමට පහසු වීම.

විගණන ක්‍රියාවලියේදී විගණකවරුන්ට සහාය වීම.

**(ඕනෑම ප්‍රතිලාභ දෙකක් පමණක් අපේක්ෂා කෙරේ)**

**(මුළු ලකුණු 40)**

**A කොටසේ අවසානය**

| අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි. | **B කොටස** |
|---|---|
| (මුළු ලකුණු 40) | |

**02 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **2 වන ඒකකය** | - | **ගිණුම්කරණ සමීකරණය, ද්විත්ව සටහන් ක්‍රමය සහ ගිණුම්කරණ සංකල්පය.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - | ව්‍යාපාර ගණුදෙනුවලින් ඇතිවන බලපෑම් ගිණුම්කරණ සමීකරණයට භාවිතාකිරීම. |

**(a)**

*(රු.'000)*

| නොං | වත්කම් | | | | ස්කන්ධය | + වගකීම් |
|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | + තොගය | + වෙළෙඳ ලැබිය යුතු මුදල් | + මුදල් | | |
| (1) | + 1,500 | | | + 500 | + 2,000 | |
| (2) | | + 800 | | | | + 800 |
| (3) | | - 300 | + 500 | | + 200 | |
| (4) | | | | | - 20<br>+ 20 | |
| (5) | | | - 400 | + 360 | - 40 | |
| (6) | | - 50 | | | - 50 | |
| (7) | - 10 | | | | - 10 | |
| **එකතුව** | **1,490** | **450** | **100** | **860** | **2,100** | **800** |

**(ලකුණු 07)**

**(b)** ලාභය = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය

= 2,100,000 - 2,000,000 + 50,000 - 20,000

= 130,000

**(ලකුණු 03)**

**(මුළු ලකුණු 10)**

**03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **3 වන ඒකකය** | - | **මූලික පොත්, පාලන ගිණුම් බැංකු සැසඳුම් ප්‍රකාශන සහ ශේෂ පිරික්සුම.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - | මූලික සටහන් පොත් පිළියෙල කිරීම සහ ලෙජර් ගිණුම්වල ගණුදෙනු වාර්තා කිරීම (මුදල් ලැබීමේ ජර්නලය, මුදල් ගෙවීමේ ජර්නලය, සුළු මුදල් පොත, දෛනික ගැනුම් පොත, දෛනික ආපසු යැවුම් පොත, දෛනික විකුණුම් පොත, දෛනික ආපසු එවුම් පොත, පොදු ජර්නලය). |
| | - | සංශෝධිත මුදල් පොත සහිතව සහ රහිතව බැංකු සැසඳුම් පිළියෙල කිරීම. |

**(A)** **විකුණුම් ජර්නලය**

| දිනය | ඉන්වොයිස් අංකය | විස්තරය | මුළු මුදල | වට්ටම් | ශුද්ධ අගය |
|---|---|---|---|---|---|
| 2025-04-05 | S145 | චමිදු ට්‍රේඩර්ස් | 40,000 | 2,000 | 38,000 |
| 2025-04-10 | S146 | රුසිරු ට්‍රේඩර්ස් | 125,000 | 12,500 | 112,500 |
| 2025-04-14 | S147 | චමත් ට්‍රේඩර්ස් | 150,000 | - | 150,000 |
| 2025-04-20 | S148 | සජිදා ට්‍රේඩර්ස් | 18,000 | 900 | 17,100 |
| පොදු ලෙජරයට මාරු කරන ලදී | | | | | **317,600** |

(ලකුණු 05)

**(B) (a)**

**ගලපන ලද මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 200,000 | ණය | 50,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 65,000 | බැංකු ගාස්තු | 5,000 |
| | | ශේෂය ප/ගෙ | 210,000 |
| | 265,000 | | 265,000 |

(ලකුණු 03)

**(b)** **බැංකු සැසඳුම් විස්තරය**

| | | |
|---|---|---|
| ගලපන ලද මුදල් පාලන ගිණුමට අනුව ශේෂය | | 210,000 |
| (+) | | |
| ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | 100,000 | |
| බැංකුව විසින් වැරදි ලෙස සිදු කළ බැර කිරීම් | 40,000 | 140,000 |
| (-) | | |
| උපලබ්ධි නොවූ තැන්පතු | 80,000 | (80,000) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | 270,000 |

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

**04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **4 වන ඒකකය** | - | **කේවලස්වාමී ව්‍යාපාරයක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - | නිශ්පාදන ගිණුම (නිශ්පාදන පිරිවැය ප්‍රකාශය) පිළියෙල කිරීම.. |

**උදාර ප්‍රකාශකයෝ**
**2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**නිෂ්පාදන ගිණුම** *(රු.'000)*

| | | |
|---|---|---|
| **අමුද්‍රව්‍ය** | | |
| ආරම්භක අමුද්‍රව්‍ය තොගය | 500 | |
| අමුද්‍රව්‍ය ගැනුම් | 6,000 | |
| ගෙන ඒමේ කුලී | 100 | |
| (-) අවසාන අමුද්‍රව්‍ය තොගය | (300) | |
| පරිභෝජනය කල අමුද්‍රව්‍ය පිරිවැය | | 6,300 |
| | | |
| **සෘජු වැටුප්** | | |
| සෘජු වැටුප් | 2,500 | |
| නිෂ්පාදන දිරිදීමනා (50 X 10) | 500 | 3,000 |
| ප්‍රාථමික පිරිවැය | | 9,300 |
| (+) ආරම්භක නොනිමි තොගය | 230 | |
| (-) අවසාන නොනිමි තොගය | (430) | (200) |
| නිෂ්පාදනය කළ ඒකකවල ප්‍රාථමික පිරිවැය | | 9,100 |
| **නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය** | | |
| යන්ත්‍ර නඩත්තු | 60 | |
| ආරක්ෂක ගාස්තු (70% X 600) | 420 | |
| විදුලි ගාස්තු (80% X 900) | 720 | |
| කුලිය (80% X 1,000) | 800 | |
| යන්ත්‍ර ක්ෂය (2,000 X 20%) | 400 | 2,400 |
| නිෂ්පාදන පිරිවැය | | 11,500 |
| (+) කර්මාන්තශාලා ලාභය (11,500 X 20%) | | 2,300 |
| වෙළෙඳ ගිණුමට මාරු කළා | | 13,800 |

**(ලකුණු 10)**

**05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**3 වන ඒකකය** - **මූලික පොත්, පාලන ගිණුම් බැංකු සැසඳුම් ප්‍රකාශන සහ ශේෂ පිරික්සුම.**

**ඉගෙනුම් ප්‍රතිඵල** - ගිණුම්කරණ වැරදි වර්ග හඳුනා ගැනීම සහ වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් පිළියෙල කිරීම වැරදි (මගහැරීම් වැරදි, පිටපත් කිරීමේ වැරදි, මූලධර්ම, හිලව් වැරදි, මූලික සටහන්වල වැරදි, ද්වීකරණ වැරදි සම්පූර්ණයෙන් අනෙකුත් සටහන් කිරිමේ වැරදි).

- අවිනිශ්චිත ගිණුමේ අරමුණ පැහැදිලි කිරීම සහ අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම .
- වැරදි මගින් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම ගණනය කිරීම.

**(a)** **පොදු ජර්නලය**

| | විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| 01 | වැටුප් වියදම් ගිණුම හර | 100,000 | |
| | ගෙවිය යුතු වැටුප් වියදම් ගිණුම බැර | | 100,000 |
| | *(ගෙවිය යුතු වැටුප් ගිණුම්ගත නොකිරීමේ වැරැද්ද නිවැරදි කිරීම)* | | |
| 02 | අවිනිශ්චිත ගිණුම හර | 100,000 | |
| | පොලී වියදම් ගිණුම බැර | | 50,000 |
| | පොලී ආදායදම් ගිණුම බැර | | 50,000 |
| | *(පොලී ආදායම ගිණුම්ගත කිරීමේ වැරැද්ද නිවැරදි කිරීම)* | | |
| 03 | මෝටර් රථ අලුත්වැඩියා වියදම් ගිණුම හර | 40,000 | |
| | මෝටර් රථ ගිණුම බැර | | 40,000 |
| | *(වාහන අලුත්වැඩියා වියදම්වල මූලික වැරැද්ද නිවැරදි කිරීම)* | | |
| 04 | අවිනිශ්චිත ගිණුම හර | 25,000 | |
| | ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුම බැර | | 25,000 |
| | *(ලිපි ද්‍රව්‍ය වියදම් දෙවරක් සටහන් වීමේ දෝෂය නිවැරදි කිරීම)* | | |
| 05 | දුරකථන වියදම් ගිණුම හර | 16,000 | |
| | අවිනිශ්චිත ගිණුම හර | 45,000 | |
| | කුලී වියදම් ගිණුම බැර | | 61,000 |
| | *(දුරකථන වියදමේ සටහන් වැරැද්ද සහ අත්හැරීමේ වැරැද්ද නිවැරදි කිරීම)* | | |

**(ලකුණු 05)**

**(b)** **අවිනිශ්චිත ගිණුම**

| | | | |
|---|---|---|---|
| පොළී වියදම | 50,000 | ශේෂය ඉ/ගෙ | 170,000 |
| පොළී ආදායම | 50,000 | | |
| පොළී වියදම | 45,000 | | |
| ලිපි ද්‍රව්‍ය | 25,000 | | |
| | 170,000 | | 170,000 |

**(ලකුණු 02)**

**(c)** **කෙටුම්පත් ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ලාභය/(අලාභය) | | (450,000) |
| (+) | | |
| පොළී වියදම | 50,000 | |
| පොළී ආදායම | 50,000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම | 25,000 | |
| කුලී වියදම | 61,000 | 186,000 |
| (-) | | |
| වැටුප් වියදම | 100,000 | |
| මෝටර් රථ අලුත්වැඩියාව | 40,000 | |
| දුරකථන වියදම | 16,000 | (156,000) |
| නිවැරදි කරන ලදී ලාභය/(අලාභය) | | (420,000) |

**(ලකුණු 03)**

**(මුළු ලකුණු 10)**

**B කොටසේ අවසානය**

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

**C කොටස**

**06 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **4 වන ඒකකය** | - | **කේවලස්වාමී ව්‍යාපාරයක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - | කේවල ස්වාමී ව්‍යාපාරයක් සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම (ලාභාලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය). |
| | - | කේවලස්වාමී ව්‍යාපාරයක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) පිළියෙල කිරීම. |

**CodeLoom**

**2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**ලාභා'ලාභ ප්‍රකාශනය** *(රු.'000)*

| | | |
|---|---|---|
| විකුණුම් | | 92,000 |
| (-) විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 8,500 | |
| ගැනුම් | 63,000 | |
| (-) අවසාන තොගය | (9,700) | (61,800) |
| **දළ ලාභය** | | **30,200** |
| **බෙදාහැරීමේ වියදම්** | | |
| මෝටර් වාහන ක්ෂය | 1,250 | |
| බොල් ණය කපා හැරීම | 200 | |
| ණයගැතියන් සඳහා අඩමාන ණය වෙන් කිරීම **(W-5)** | 450 | |
| විකුණුම් කොමිස් | 400 | (2,300) |
| **පරිපාලන වියදම්** | | |
| විදුලිය (78 + 3,100) | 3,178 | |
| ගොඩනැගිලි ක්ෂය | 600 | |
| යන්ත්‍ර ක්ෂය | 1,800 | |
| කුලිය (3,500 – 500 + 600) | 3,600 | |
| වැටුප් | 15,500 | |
| රක්ෂණ | 600 | |
| ආරක්ෂක වියදම | 750 | (26,028) |
| **මූල්‍ය වියදම්** | | |
| පොළී වියදම | 240 | (240) |
| **වසර සඳහා ලාභය** | | **1,632** |

**(ලකුණු 11)**

## CodeLoom

2025 මාර්තු 31 වන දිනට

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** *(රු.'000)*

| **ජංගම නොවන වත්කම්** | **පිරිවැය** | **සමුච්චිත ක්ෂය** | **ධාරණ අගය** |
|---|---|---|---|
| ඉඩම | 5,000 | - | 5,000 |
| ගොඩනැගිලි | 6,000 | 3,600 | 2,400 |
| යන්ත්‍ර | 9,000 | 6,300 | 2,700 |
| මෝටර් වාහන | 5,000 | 3,750 | 1,250 |
| | 25,000 | 13,650 | 11,350 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 9,700 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් (7,700 - 200) | 7,500 | | |
| (-) හානිකරණ වෙන් කිරීම් (7,500 x 10%) | (750) | 6,750 | |
| කුලී තැන්පතු **(W-3)** | | 500 | |
| බැංකුවේ මුදල් | | 500 | |
| අතැති මුදල් | | 25 | 17,475 |
| **මුළු වත්කම්** | | | **28,825** |
| | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය | | 13,000 | |
| වසර සඳහා ලාභය | | 1,632 | 14,632 |
| | | | |
| **දිගු කාලීන වගකීම්** | | | |
| බැංකු ණය | | 8,000 | 8,000 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 5,275 | |
| උපචිත වියදම් **(W-2)** | | 678 | |
| ගෙවිය යුතු ණය පොළිය **(W-1)** | | 240 | 6,193 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | | **28,825** |

**(ලකුණු 09)**

**පෙර වැඩ:**

**W1 - ණය පොලිය**

| | |
|---|---|
| ණය | 8,000 |
| පොළී අනුපාතය | 12% |
| මාස ගණන | 3/12 |
| පොළිය | 240 (8,000 x 12% x 3/12) |

**W2 - උපචිත වියදම්**

| | |
|---|---|
| විදුලි බිල් | 78,000 |
| කුලිය | 600,000 |
| | **678,000** |

**W2 - ක්ෂයවීම්**

(රු.'000)

| | **ගොඩනැගිලි** | **යන්ත්‍ර** | **මෝටර් වාහන** |
|---|---|---|---|
| පිරිවැය | 6,000 | 9,000 | 5,000 |
| ක්ෂයවීම් % | 10% | 20% | 25% |
| ක්ෂයවීම් | 600 | 1,800 | 1,250 |

**W3 - කුලී තැන්පතුව**

කුලී තැන්පතුව 500 (ගෙවූ කුලිය ඇතුළත්ව)

ද්විත්ව සටහන් ඇතුළත් කිරීම

| | | |
|---|---|---|
| කුලී තැන්පතුව | හර රු.500 | |
| ගෙවූ කුලිය | | බැර රු.500 |

**W4 - ගෙවිය යුතු / උපචිත කුලිය**

| | |
|---|---|
| මාසික කුලිය | 300 |
| මාස ගණන | 12 |
| මුළු කුලිය | 3,600 |
| ගෙවූ කුලිය | 3,000 (3,500-500) |
| උපචිත කුලිය | 600 (3,600 - 3,000) |

**W5 - ණයගැතියන් සඳහා වෙන් කිරීම**

| | |
|---|---|
| වෙළඳාම ලැබිය යුතු මුදල | 7,500 (7,700 - 200) |
| අඩමාන ණය % | 10% |
| ණයගැතියාගේ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | 750 (7,500 x 10%) |
| ආරම්භක ණයගැතියාගේ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | 300 |
| ඌණ ප්‍රතිපාදනය | 450 (750 - 300) |

**(මුළු ලකුණු 20)**

**C කොටසේ අවසානය**